ආගරපතන ප්‍රාදේශීය සභාව
නුවරඑළිය දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 21 දින ද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 ජුනි 19 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ආගරපතන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි 05 ක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ii) | සභාව සතු රු.462,880 ක් වූ ත්‍රීරෝද රථයේ වටිනාකම සහ රු.279,300 ක් අත්කරත්තවල වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (iii) | ස්ථාවර වත්කම් ශේෂය ප්‍රාග්ධන යෙදවුමට ආදායමින් දායකවීමේ ගිණුමේ ශේෂයට සමාන විය යුතු වුවද, එම ශේෂ දෙක අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.1,162,194 ක වෙනසක් තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

| | | | |
|---|---|---|---|
| (iv) | සමාලෝචිත වර්ෂයේ මාර්තු සිට දෙසැම්බර් දක්වා කාලයට අදාළව අයවිය යුතු උසාවි දඩ ආදායම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (v) | ස්ථාන මාරුවී පැමිණි නිළධාරියෙකුගේ පවරාගත් ණය ශේෂය රු.152,129 ක් සමුච්චිත අරමුදල් ගිණුමට බැර කර තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (vi) | සමාලෝචිත වර්ෂයට අදාළ විගණන ගාස්තු සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

(ආ) නොසැසඳූ පාලන ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ගිණුම් විෂයන් 03 කට අදාළ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂයන් හා ඒවාට අදාළ උපයෝගි ලේඛන අතර රු.238,274 ක වෙනසක් පැවතුණි. | කාලීනව උපයෝගි ලේඛන සහ පාලන ගිණුම් තුලනය කිරීම කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.12,810,629 ක් වූ ගිණුම් විෂයයන් 05 කට අදාළ තහවුරු කිරීමේ සාක්ෂි ඉදිරිපත් නොකෙරුණි. | දේපළ සඳහා ඔප්පු පිළියෙල කර ගැනීම සහ ලේඛන යාවත්කාලීන කර ගැනිමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

1.4 අනුකූල නොවීම්

------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

--------------------------------------------------------------------------------

| | නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ කාර්යසාධන වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. | කාර්යසාධන වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ආ) | 2006 අංක 12 දරන මුද්දර ගාස්තු පනත, | 2018 අප්‍රේල් සිට 2019 දෙසැම්බර් දක්වා කාලය තුළ රැස්කළ මුද්දර බදු දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කර නොතිබුණි. | අදාළ නීති ප්‍රකාරව බදු ප්‍රේෂණය කිරීමට කටයුතු කළ යුතු වේ. | දේශිය ආදායම් දෙපාර්තමේන්තුවේ මුද්දර බදු සඳහා ලියාපදිංචිවී නොතිබිම නිසා බදු ප්‍රේෂණය නොකළ අතර මේ වන විට ලියාපදංචිය සඳහා අයදුම්කර ඇත. |
| (ඇ) | 2009 අංක 09 දරන ජාතිය ගොඩනැගිමේ බදු පනත | සභාව විසින් 2018 අප්‍රේල් සිට 2019 දෙසැම්බර් දක්වා රැස්කළ ජාතිය ගොඩනැගීමේ බදු ප්‍රේෂණය කර නොතිබුණි. | අදාළ නීති ප්‍රකාරව බදු ප්‍රේෂණය කිරීමට කළ යුතු වේ. | දේශිය ආදායම් දෙපාර්තමේන්තුවේ ජාතිය ගොඩනැගිමේ බදු සඳහා ලියාපදිංචි වී නොතිබිම නිසා බදු ප්‍රේෂණය නොකළ අතර මේ වන විට ලියාපදංචිය සඳහා අයදුම්කර ඇත. |
| (ඈ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 218 | ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ වාර්ෂික සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | අදාළ සමීක්ෂණය සිදුකළ යුතු වේ. | ඉදිරි වර්ෂයන්හිදී අදාළ සමීක්ෂණ කටයුතු සිදු කිරීමට කටයුතු කරමි. |
| (ඉ) | පළාත් පාලන කොමසාරිස්ගේ 1988 මැයි 17 දිනැති අංක 1988/22 දරන චක්‍රලේඛය | වරිපනම් බදු අයකරන ප්‍රදේශවල දේපළ තක්සේරුව වසර 05 කට වරක් සිදුකළ යුතු වුවද, වරිපනම් බදු අයකරන දේපළ 2008 වර්ෂයට පසු නැවත තක්සේරු කර නොතිබුණි. | අදාළ චක්‍රලේඛයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු වේ. | ආගරපතන ප්‍රාදේශිය සභාව 2018.03.20 දින සිට ක්‍රියාත්මක වන බැවින් හා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැති වීම හේතුවෙන් අඩුපාඩු සිදුවූ අතර මේ වන විට නව තක්සේරුවක් සිදු කිරීම සඳහා ප්‍රධාන තක්සේරුකරුගෙන් ඉල්ලීම් කර ඇත. |

2. මූල්‍ය සමාලෝචනය
-----------------------
2.1 මූල්‍ය ප්‍රතිඵල
-----------------
ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු.1,504,768 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස නවය සඳහා පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු.4,965,288 ක් විය.

2.2 ආදායම් පරිපාලනය
-----------------------
2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්
------------------------------------------------------------------------------------------
සමාලෝචිත වර්ෂයයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල පරිච්ඡේදය සඳහා ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 6,879,217 | 3,108,701 | 3,126,273 | 1,692,840 | 1,036,075 | 1,203,694 | 1,210,963 | 750,350 |
| කුලී | 228,000 | 14,285 | 17,608 | 16,260 | 90,000 | 25,545 | 22,840 | 14,782 |
| බලපත්‍ර ගාස්තු | 2,470,000 | 2,103,130 | 2,103,130 | - | 1,280,000 | 1,106,560 | 31,910 | - |
| වෙනත් ආදායම් | 3,101,000 | 1,519,065 | 2,481,271 | 793,183 | 5,531,600 | 992,044 | 782,588 | 719,088 |
| | 12,678,217 | 6,745,181 | 7,728,282 | 2,502,283 | 7,937,675 | 3,327,843 | 2,048,301 | 1,484,220 |

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

(අ) වරිපනම් බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2019 ජනවාරි 01 දිනට පැවති රු.892,938 ක වරිපනම් බදු හිඟයෙන් වර්ෂය තුළ අයකිරීම සියයට 34 ක් වූ අතර වර්ෂය තුළ බිල්කළ වරිපනම් බදු ආදායමින් අය කිරීමද සියයට 40 ක් විය. | ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන අනුව හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

(ආ) ජල ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව යටතේ ක්‍රියාත්මක ජල ව්‍යාපෘති 11 න් 2019 දෙසැම්බර් 31 දිනට හිඟ මුදල රු.486,750 ක් විය. මෙතෙක් ජල සැපයුම් විසන්ධි නොකළ රු.2000 ට වැඩි හිඟයන් පවතින ජල පාරිභෝගික සංඛ්‍යාව 46 ක් වූ අතර ඔවුන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ මුදල රු.155,316 ක් විය. | ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන අනුව හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | රු.49,029 ක හිඟය සඳහා රතු නිවේදන ඉදිරිපත් කර ඇති අතර රු.41,440 ක ආදායමක් අය කරගෙන ඇත. |

(ඇ) උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| උසාවි දඩ රු.397,683 ක් හා ඉඩම් හුවමාරු කිරීමේ මුද්දර ගාස්තු රු.393,500 ක් අයවිය යුතුව තිබුණි. | අදාළ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

3. මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

3.1. කාර්යසාධනය
-----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යන් ඉටුකිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ක්‍රියාකාරි සැලැස්ම
----------------------

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි | ක්‍රියාකාරී සැලැස්මක් ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ. | 2020 වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර ඇත. |

(ආ) අතහැර දැමූ කර්තව්‍යයන්
----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2019 විශේෂ අවශ්‍යතා සහිත ගම්මාන සංවර්ධන වැඩසටහන යටතේ නාගසේන නගරයේ වැසිකිළියක් ඉදිකිරීම සඳහා රු.616,770 ක ප්‍රතිපාදන සලසා 2019 නොවැම්බර් 15 දිනට පෙර නිමකළ යුතු ලෙස කොන්ත්‍රාත්කරුවකුට පවරා වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස රු.123,354 ක් ගෙවා තිබුණි. එහෙත් ඉඩමේ අයිතිය පිළිබඳ ගැටළුවක් හේතුවෙන් ව්‍යාපෘතිය අතහැර දමා තිබූ අතර දරන ලද වියදම නිශ්ඵල වී තිබුණි. | ගැටළු නිරාකරණය කරගෙන ව්‍යාපෘති ආරම්භ කළ යුතුවේ. | ඉඩමේ ගැටළුව සඳහා නිසි විසඳුමක් ලද විගස සභා අරමුදලින් ඉතිරි ඉදිකිරීම් කටයුතු සිදු කිරීමට කටයුතු කරමි. |

(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ එකතු කරන කසළ මහවැලි ගඟට මුදාහරිමින් පැවතිණි. | විධිමත් පරිදි පරිසරයට හානියක් නොවන අයුරින් අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමට කටයුතු කළ යුතු වේ. | විගණනයෙන් පෙන්වාදුන් කසළ බැහැර කරන ස්ථාන පස් දමා වසා ඇති අතර නැවත එසේ නොකරන ලෙස සේවකයින් දැනුවත් කර ඇත. |

(ඈ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක පිළිබඳව ප්‍රාදේශීය සභාව ප්‍රමාණවත්ව දැනුවත්වී නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක සපුරා ගැනීම සඳහා සැලසුම් සකස් කිරීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 වර්ෂය තුළ සභාවේ සේවය කළ සේවකයින් 05 දෙනෙකු වෙනුවෙන් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවා නොතිබූ අතර සේවක අර්ථසාධක මුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට ගෙවීම සඳහා රු.177,690 ක් වෙන්කර තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | අදාළ චක්‍රලේඛයේ විධිවිධාන අනුව කටයුතු කිරීමට කටයුතු කළ යුතු වේ. | අදාළ සේවකයින් එම අරමුදල්වල ලියාපදිංචි වී නොමැති බැවින් දායක මුදල් ප්‍රේෂණය නොකළ අතර මේ වන විට ලියාපදිංචි වීමට අදාළ අයදුම්පත් යොමුකර ඇත. |
| (ආ) | 2019 නොවැම්බර් 02 දින අංක 2096 දරන ගැසට් නිවේදනය මගින් දුරකථන කුළුණු ඉදි කිරීම, ගුවන්විදුලි සහ රූපවාහිනි විකාශන | අතුරු ව්‍යවස්ථා පනවා අදාළ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු | අදාළ කුළුණු ඉදිකර තිබුණු ආයතනවල තොරතුරු ලබාගෙන ගාස්තු අය කිරීමට කටයුතු කරමි. |

| | | |
|---|---|---|
| කුළුණු ඉදි කිරීම සහ එම බලපත්‍ර අළුත් කිරීම සඳහා ගාස්තු අය කරන බව ප්‍රසිද්ධ කර තිබුණද, සභා බල ප්‍රදේශය තුළ ස්ථාපිත කර ඇති සම්ප්‍රේෂණ කුළුණුවලින් කිසිදු ගාස්තුවක් අයකරගෙන නොතිබුණි. | වේ. | |
| (ඇ) කොන්ක්‍රීට් මාර්ග ඉදිකිරීම්වල තත්ත්ව පරික්ෂාවන් සිදු කිරීම සඳහා නුවරඑළිය ප්‍රාදේශීය සභාවට අදාළ කොන්ත්‍රාත්කරුවන් විසින් ගෙවීම්කර නොතිබුණු නමුත් කොන්ක්‍රීට් මාර්ග දෙකක තත්ත්ව පරික්ෂාවන් සිදු කිරීමට රු.35,000 ක් සභාව විසින් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා තිබුණි. | අවශ්‍ය තහවුරු කිරීම් කරගෙන ගෙවීම් කළ යුතු වේ. | එම සමිති මහනුවර ඉංජිනේරු කාර්යාලයට හෝ මුදල් ගෙවා ඇති නම් ඒවාට අදාළ ලදුපත් ඉදිරිපත් කරන ලෙස කොන්ත්‍රාත්කරු වෙත දැනුම්දී ඇත. |

3.3 මානව සම්පත් කළමනාකරණය
-----------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තනතුරු 18 ක පැවති පුරප්පාඩු 71 ක් සම්පූර්ණ කිරීමට කටයුතු කර නොතිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා
------------------------------

වාහන උපයෝජනය
-----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ක්‍රියාවිරහිත වී ඇති රෝද 4 ට්‍රැක්ටර් රථයක් සහ ට්‍රේලරයක් ප්‍රයෝජනයට නොගෙන නිශ්කාර්යව පැවතුණි. | අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතු වේ. | සේවා අවශ්‍යතාවය මත පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ උපදෙස් පරිදි වලපනේ ප්‍රාදේශිය සභාවට ලබාදී ඇත. |

3.5 වත්කම් කළමනාකරණය

3.5.1 නිශ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මෙරායා නගරයේ පිහිටි ගොඩනැගිල්ල තුළ සභාවේ ආයුර්වේදය සහ පුස්තකාලය ස්ථාපිත කිරීමට අපේක්ෂිතව පැවතියද 2020 ජනවාරි 09 දින වනවිටද ආයුර්වේදය සහ පුස්තකාලය ස්ථාපනය නොකර ගොඩනැගිල්ල නිශ්කාර්යව පැවතුණි. | ආයුර්වේදය සහ පුස්තකාලය හැකි ඉක්මනින් ආරම්භ කිරීමට කටයුතු කළ යුතු වේ. | සභාව සඳහා ස්ථිර ආයුර්වේද වෛද්‍ය නිළධාරියෙකු නොමැති වීමත් ඖෂධ සංයෝජක තනතුර පුරප්පාඩු වීමත් නිසා ආයුර්වේදය ආරම්භ කිරීමට නොහැකි විය. පුස්තකාල සහයකයෙකු නොමැති වීම හේතුවෙන් පුස්තකාලයද ආරම්භ කිරීමට නොහැකි විය. |

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

4.1 අයවැය පාලනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය අනුව විෂයයන් 02 ක වියදම, ඇස්තමේන්තුව ඉක්මවා තිබූ අතර එලෙස ඉක්මවූ වියදම් සඳහා ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති 14 අනුව පරිපූරක ඇස්තමේන්තු අනුමත කරගැනීමට කටයුතු කර නොතිබුණි. | මූල්‍ය හා පරිපාලන රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

| | | |
|---|---|---|
| (ඇ) 1988 ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති 193 අනුව අයවැයගත මූල්‍ය ප්‍රතිපාදන සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර සිදුවී තිබෙන වෙනස්වීම් පිළිබඳව කරුණු පැහැදිලි කිරීමේ ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය හා පරිපාලන රීතී ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

4.2 අභ්‍යන්තර විගණනය

------------------------

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |